**ඌවපරණගම ප්‍රාදේශීය සභාව**

**බදුල්ල දිස්ත්‍රික්කය**

----------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

-----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දිනද ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 15 දිනද විගණනයට ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 06 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 **මතය**

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ඌවපරණගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේ දී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් 2014 වර්ෂයේ සභාව වෙත ලබාදී තිබූ රු.403,316 ක් වූ ගැල්වනයිස් කොඩිකණු 408 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල රු.255,038 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සභා ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වැයකරන ලද රු.3,562,252 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.65,073 ක් වූ ලිපිද්‍රව්‍ය තොගය ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ජල යෝජනා ක්‍රම හා කුට්ටි ගල් කොන්ක්‍රීට් ව්‍යාපෘතියට අදාල රු.502,244 ක් වූ අවසාන ඉතිරි තොගය රු.5,293,786 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ප්‍රතිසංස්කරණය කරන ලද ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල සඳහා 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.764,238 ක් වූ බිල්පත් වටිනාකම වෙනුවෙන් වර්ෂාවසානයේ රු.1,749,289 ක ණයහිමි ප්‍රතිපාදන වෙන්කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,642,001 ක් වූ විවිධ තැන්පත් වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල රු.551,553 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණු අතර, 2013 හා 2014 වර්ෂවලට අදාලව සමාලෝචිත වර්ෂයේ දී ගෙවන ලද රු.103,825 ක් වූ විගණන ගාස්තු වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඌ) 2013 වර්ෂයේදී රු.9,281,250 ක් ගෙවා මිලදී ගත් ලූණුවත්ත ඉඩමේ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(එ) 2012 වර්ෂය වෙනුවෙන් අයවිය යුතු රු.1,961,125 ක් වූ උසාවි දඩ ආදායම් ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 **නොසැසඳූ පාලන ගිණුම්**

----------------------------

(අ) උපලේඛන අනුව රු.31,528,584 ක් වූ කොන්ත්‍රාත් ණයහිමි ශේෂය මූල්‍ය ප්‍රකාශනවල රු.20,728,584 ක් ලෙස දැක්වීමෙන් රු.10,800,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) උපලේඛන අනුව රු.986,819 ක් වූ නොපියවූ අත්තිකාරම් වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල රු.4,178,495 ක් ලෙස දැක්වීමෙන් රු.3,191,676 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 36,301,876 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.23,058,729 ක් විය.

1.3.4 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

---------------------------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ 2008 ජනවාරි 25 දිනැති අංක 1523/16 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය | 2015 වර්ෂය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර 23 ක් සඳහා එම බලපත්‍ර ලබා නොදී වෙළෙඳ බලපත්‍ර නිකුත් කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XXI | සේවය හැරගිය හා ස්ථාන මාරුවී ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් සභාවට අයවිය යුතු එකතුව රු.220,454 ක සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2009 සැප්තැම්බර් 18 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ PF/437 | සියලුම රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන විසින් රක්ෂණාවරණයක් ලබාගැනීමේ දී ජාතික රක්ෂණ භාරඅරමුදල වෙතින් හෝ සීමා සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙතින් පමණක් සෘජුවම ලබාගත යුතු වුවද, සභාව විසින් රථවාහන 07 ක් සඳහා රක්ෂණ නියෝජිතයෙකු මඟින් රක්ෂණාවරණයන් ලබාගෙන තිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

-----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,882,900 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,143,360 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

---------------------

**උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.5,000,000 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.8,259,509 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

(ආ) 2013, 2014 හා 2015 වර්ෂ වෙනුවෙන් වූ උසාවි දඩ උපලේඛන සකස් කර සභාවට අයත් ආදායම හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

රංහවඩිගම කඩ කාමර ඉදිකිරීමට සභාවට අයත් බිම්කොටස් බදුදීම සඳහා බදුකරුවන් 09 දෙනෙකුගෙන් 2005 හා 2006 වර්ෂවලදී අයකර ගන්නා ලද බදු කුලී රු.124,000 ක් අදාල වර්ෂයේ ආදායමක් ලෙස නොසලකා තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

4. **යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

---------------------------------------

4.1 **අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂයේ දී අයවැය ලේඛනය, ආදායම් හා වියදම් පාලනයේදී පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------------

ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි.

4.3 **අභ්‍යන්තර විගණනය**

----------------------

2015 වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.4 **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

-----------------------------------------------------

ප්‍රවර්තන වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කර නොතිබුණි.

4.5 **වත්කම් කළමනාකරණය**

---------------------------

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------

ක්‍රියාන්විත රාජකාරි සඳහා යුධ හමුදාව වෙත ලබාදී තිබී ආපසු 2015 මැයි 26 දින සභාවට භාරදෙන ලද කැබ් රථය පාවිච්චියට නුසුදුසු බැවින් ධාවනයෙන් ඉවත් කර තිබුණද, 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඉ) තොග පාලනය